# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2003 අංක 38 දරන ජාතික වැවිලි කළමනාකරණ ආයතන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2003 නොවැම්බර් මස 14 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 නොවැම්බර් මස 14 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. **6.75** යි. තැපැල් ගාස්තුව : රු. **4.50** යි.

## 2003 අංක 38 දරන ජාතික වැවිලි කළමනාකරණ ආයතන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2003 නොවැම්බර් මස 14 වන දින]

එල්.ඩී.— ඕ. 17/99.

**1979 අංක 45 දරන ජාතික වැවිලි කළමනාකරණ ආයතන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2003 අංක 38 දරන ජාතික වැවිලි කළමනාකරණ ආයතන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. 1987 අංක 5 දරන පනතින් සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 45 දරන ජාතික වැවිලි කළමනාකරණ ආයතන පනතේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :– 1979 අංක 45 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) (ඌ) ඡේදයේ "සහ" යන වචනය ඉවත් කිරීමෙන් ; සහ

(ii) (ඔ) ඡේදය ට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :–

"(ඕ) වැවිලි කර්මාන්ත කළමනාකරණයෙහි ආයෝජන ප්‍රවර්ධනය කිරීම ;

(ක) වැවිලි සහ වැවිලි කළමනාකරණයට අදාළ දත්ත එකතු කිරීම් සහ බෙදා හැරීම භාර ගැනීමට සහ වැවිලි කර්මාන්තවල සංවර්ධන ශක්‍යතාව අවබෝධකර ගැනීම සඳහා පර්යේෂණ පැවැත්වීම ; සහ

(ග) වැවිලි කර්මාන්ත කළමනාකරණයට උචිත ප්‍රතිපත්ති පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම සහ වෙනත් අදාළ නියෝජ්‍යායතන සමඟ සම්බන්ධීකරණය වීම.".

**3**. 1981 අංක 76 දරන පනත සහ 1987 අංක 5 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :–

"(1) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලන මණ්ඩලයක් ආයතනයට තිබිය යුතු අතර ඒ

2-H 019155 - 4,500 (2003/07)

මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :–

(අ) නිල බලයෙන් පත්විය යුතු පහත සඳහන් සාමාජිකයන්, එනම්–

(i) ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂවරයා ලෙසින් තත් කාලයේ ධුරය දරන තැනැත්තා ;

(ii) 1993 අංක 52 දරන පනතින් සංස්ථාපනය කරන ලද තේ පර්යේෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ ලෙස තත් කාලයේ ධුරය දරන තැනැත්තා ;

(iii) රබර් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ලෙස තත් කාලයේ ධුරය දරන තැනැත්තා ; සහ

(iv) පොල් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ලෙස තත් කාලයේ ධුරය දරන තැනැත්තා ;

(ආ) අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන පහත දැක්වෙන නම් කළ සාමාජිකයන්, එනම් –

(i) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පනත මගින් පිහිටුවනු ලැබූ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් නම් කරනු ලබන ඒ අධිකාරියේ නියෝජිතයකු ;

(ii) (291 වන අධිකාරය වන) ලංකා වැවිලි කරුවන්ගේ සංගමය ආඥාපනත මගින් පිහිටුවනු ලැබූ ලංකා වැවිලි කරුවන්ගේ සංගමය විසින් ශ්‍රී ලංකා තේ සංගමය (ටී. ඒ. එස්. එල්) අමතා, නම් කරනු ලබන ඒ සංගමයේ නියෝජිතයකු ;

(iii) වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යාංශයේ නියෝජිතයන් දෙදෙනෙකු ;

(iv) වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නිර්නායක පදනම් කොට ගෙන තෝරා ගනු ලැබිය යුතු වෘත්තීය සමිති නියෝජනය කරනු ලබන සාමාජිකයින් දෙදෙනකු ;

මේ ඡේදයේ කාර්ය සඳහා "වෘත්තිය සමිති" යන්නට (138 වන අධිකාරය වන) වෘත්තීය සමිති ආඥාපනතේ එයට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

(v) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යාංශයේ නියෝජිතයකු ;

(vi) කුඩා තේ වතු සංවර්ධන සමිති සම්මේලනය විසින් ශ්‍රී ලංකා තේ සංගමය (ටී. ඒ. එස්. එල්.) අමතා, නම් කරනු ලබන එක් සාමාජිකයකු ;

(vii) පෞද්ගලික තේ කම්හල් හිමියන්ගේ සංගමය විසින් ශ්‍රී ලංකා තේ සංගමය (ටී. ඒ. එස්. එල්.) අමතා, නම් කරනු ලබන ඒ සංගමයේ එක් සාමාජිකයකු ;

(viii) 2000 අංක 23 දරන තුරුසවිය අරමුදල පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ තුරුසවිය සමිති වලින් නම් කරන ලද ඒ සමිතිවල නියෝජිතයකු;

(ix) පොල් වවන්නන්ගේ සංගමය විසින් නම් කරනු ලබන ඒ සංගමයේ නියෝජිතයකු.".

(2) ඒ වගන්තියේ (2) උපවගන්තිය ඉවත්කොට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(2) (අ) මණ්ඩලයේ පත් කළ සාමාජිකයන් අතුරින් එක් අයකු සභාපතිවරයා ලෙස අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(ආ) තත්කාර්ය සඳහා අමාත්‍යවරයා අමතන ලිපියක් මගින් සභාපතිවරයාට සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(ඇ) අමාත්‍යවරයා විසින් හේතු දක්වා සභාපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(ඈ) (ආ) සහ (ඇ) ඡේදවල විධිවිධානවලට යටත් ව සභාපතිවරයාගේ ධුර කාලය ඔහු මණ්ඩලයේ සාමාජිකත්වය දරන කාලසීමාව වේ.

(3) ඒ වගන්තියේ (4) උපවගන්තියේ (අ) ඡේදයෙහි “(1) උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ” යන වචන වෙනුවට “(1) උපවගන්තියේ (ආ) ඡේදය යටතේ” යන වචන ආදේශ කිරීමෙන්”; සහ

(4) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ “(1) උපවගන්තියේ (ආ) ඡේදය යටතේ” යන වචන වෙනුවට “(1) උපවගන්තියේ (අ) ඡේදය යටතේ” යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ඒ වගන්තියේ (1) උපවගන්තියේ “6 වන වගන්තියේ (1) උපවගන්තියේ (ඇ) ඡේදය” යන වචන සහ ඉලක්කම් වෙනුවට “6 වන වගන්තියේ (1) උපවගන්තියේ (ආ) ඡේදය” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

“(1) අමාත්‍යවරයා විසින් එසේ කිරීම අත්‍යවශ්‍ය වන්නේ යයි සලකනු ලබන අවස්ථාවක 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත්කරනු ලැබූ මණ්ඩලයේ යම් සාමාජිකයකු හේතු දක්වා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය :

එසේ වුවද, (ආ) ඡේදයේ (iv) වන අනු ඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු ඉවත් කළහැකි වන්නේ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව පමණක් වන්නේ ය.”.

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 30අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය :– ප්‍රධාන ප්‍රඥප්තියට 30අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"නියෝග. 30අ. (1) පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර එසේ පළකරනු ලැබූ දින හෝ එම නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ඉන් පසු දිනක සිට බලාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොවූ සෑම නියෝගයක් ම ඒ අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ ඊට කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය. යම් නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳව නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.".

**7**. මේ පනත ආරම්භවීමට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන්නා වූ මණ්ඩලයේ සාමාජිකයන් මේ පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය යටතේ මණ්ඩලය නැවත සංස්ථාපනය කරන තෙක් එලෙස ධුර දැරීම දිගටම කරගෙන යා යුතු ය. අන්තර්කාලීන විධිවිධාන.

**8**. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.